**ශීර්ෂය 123 - නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදි.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ආදායම් ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරින් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියලු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 123 - නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 10 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.8 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේ දී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය. විධිවිධානවලට අනුකූලව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය ඉටු කිරීමේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සාරාංශගත කර පහත සඳහන් සටහනේ දක්වා ඇත.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 127(1) (අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම . දෙපාර්තමේන්තු කටයුතු සිදු) කළ යුත්තේ හුදෙක් මූල්‍ය හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව පමණක් නොව, රාජ්‍ය කටයුතු ඉටු කිරීමේදී බලාපොරොත්තුවන අවංකභාවය පිළිබඳ උසස් තත්ත්වයන්ට අනුකූල බව) | ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.6 |
| 127(1) (ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම . | 1. කළමනාකරණ අඩුපාඩු<br>2. අනුකූල නොවීම්<br>3. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.3<br>2.7<br>2.8 |

| | | | |
|---|---|---|---|
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.1 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | රජය සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා නොකිරීම | 2.3 |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.5 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

**(අ)** සමාලෝචිත වර්ෂය තුළ විවිධ ව්‍යාපෘති 08 ක් යටතේ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 3,234 ක් වූ නිවාස ඒකක 15,836 ක් ඉදිකිරීමට සැලසුම්කර තිබුණද තථ්‍ය වශයෙන් ඉදිකර අවසන් කර තිබුණේ නිවාස ඒකක 8,233 ක් පමණි. මෙම ව්‍යාපෘති 08 යටතේ සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණු ප්‍රතිපාදනය රුපියල් මිලියන 2,727 ක් වූ අතර ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 08 සිට සියයට 97 දක්වා වූ පරාසයක පැවතුණි.

**(ආ) ව්‍යාපෘතිවල කොටසක් පමණක් නිමකර අවසන් කිරීම**

**අවිච්ඡේද නිවාස වැඩසටහන**

(i) <u>ආදර්ශ ගම්මාන වැඩසටහන</u>
2016 ජනවාරි මස ආරම්භ කර 2017 මාර්තු මස අවසන් කිරීමට නියමිතව තිබූ මෙම වැඩසටහන සඳහා රුපියල් මිලියන 1,388 වැය කර තිබූ අතර අපේක්ෂිත නිවාස ප්‍රමාණය වූ නිවාස 4,382 න් නිවාස 2,054 ක පමණක් වැඩ අවසන් කර තිබුණි. වහල සම්පූර්ණ වූ නිවාස 2,207 ක් ද වහල මට්ටම දක්වා ඉදිකර තිබෙන නිවාස 114 ක් ද තිබුණි. එසේ වුවද, ජලය, මාර්ග වැනි මූලික යටිතල පහසුකම් නිසි පරිදි නොතිබුණි. නිවාසවල වැඩ අවසන් කර ගැනීමට උනන්දුවක් නොමැති නිවාස සඳහා ලබාදෙන ණය මුදල් සීමා කර ව්‍යාපෘතිය අවසන් කර ඇති බව නිරීක්ෂණය විය.

(ii) <u>විසිරි නිවාස වැඩසටහන</u>

2016 වර්ෂයේ ජනවාරි මස ආරම්භ කර 2017 මාර්තු මස අවසන් කිරීමට නියමිතව තිබූ මෙම වැඩසටහන සඳහා රුපියල් මිලියන 4,302 ක් වැය කර තිබූ අතර අපේක්ෂිත නිවාස ප්‍රමාණය වූ නිවාස 16,950 න් නිවාස 15,032 ක පමණක් වැඩ අවසන් කර තිබුණි. වහල දක්වා ඉදිකිරීම් සම්පූර්ණ වූ නිවාස 614 ක් සහ වහල මට්ටම දක්වා ඉදිකිරීම් නිම වූ නිවාස 15 ක් ද තිබුණි. නිවාසවල වැඩ අවසන් කර ගැනීමට උනන්දුවක් නොදක්වන ප්‍රතිලාභින්ට නිවාස සඳහා ලබා දෙන ණය මුදල් සීමාකර වැඩසටහන අවසන් කර ඇති බව නිරීක්ෂණය විය.

**(ඇ) ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු අරමුණු ඉටු නොවීම**

<u>වැලිඔය නිවාස ව්‍යාපෘතිය</u>

2016 වර්ෂයේ ජනවාරි මස ආරම්භ කර 2017 මාර්තු මස අවසන් කිරීමට නියමිතව තිබූ මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 368 ක් වැය කර තිබූ අතර ඉලක්කගත නිවාස සංඛ්‍යාව වූ නිවාස 1,042 න් නිවාස 995 ක් නිමකර තිබූ අතර වහලය දක්වා සම්පූර්ණ වූ නිවාස 47 තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රදේශයේ ජලය වැනි ස්වභාවික සාධක ගැන නිසි අධ්‍යයනයක් කර ඒ පිළිබඳ සොයා බැලීමකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නිසා ප්‍රදේශයේ පවතින ජල හිඟය හේතුවෙන් බොහොමයක් ප්‍රතිලාභින් පදිංචිය හැර ගොස් ඇති බව නිරීක්ෂණය විය.

## 2.2 වත්කම් කළමනාකරණය

-----------------------------

ජීප් රථයක් 2016 ජුනි මස සිට 2017 පෙබරවාරි මස දක්වා මාස 06 කට වඩා වැඩි කාලයක් භාවිතා කිරීමකින් තොරව ගාල් කර තබා නිෂ්කාර්යව තිබුණි.

## 2.3 කළමනාකරණ දුර්වලතා

-----------------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) කොළඹ දිස්ත්‍රික්කය තුළ මුදල් ගෙවා අවසන් කර ඇති නිවාසලාභීන්ට/ ඉඩම්ලාභීන්ට ඔප්පු නිකුත් කිරීම අවුරුදු 01 සිට අවුරුදු 33 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.

(ආ) බදු කුලී පදනම මත දී ඇති මහල් නිවාස/ නිවාස ඒකකවල සින්නක්කර අයිතිය පැවරීමේ දී අදාළ නිවසෙහි වටිනාකම තිබුණේ නිවාසලාභීන් බදු කුළී පදනම මත පදිංචි වූ දිනයන් පදනම් කරගෙන තීරණය කර තිබුණි. ඒ අනුව වසර 24 සිට 43 දක්වා කාලයකට අදාල මිල මත වටිනාකම තීරණය කර තිබුණි. එම අංක 2002/දෙ.කළ/01 සහ 2002 ජනවාරි 16 දිනැති ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිගේ චක්‍රලේඛය පාදක කර ගනිමින් එකවර මුදල් ගෙවීමේදී තවත් සියයට 50 සිට සියයට 95 දක්වා වූ පරාසයක වට්ටම් සහිතව අඩු මිලකට මෙම නිවාස ලබා දී ඇති බව නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය විය.

(ඇ) ඉහත සඳහන් අංක 2002/දේ.කළ/01 සහ 2002 ජනවාරි 16 දිනැති චක්‍රලේඛයට පටහැනිව නිවාසවල සින්නක්කර අයිතිය පැවරීමේ දී නිවාස 04 කට අදාළව ලබා දිය යුතු ප්‍රතිශතයට වඩා සියයට 10 ක වැඩි ප්‍රතිශතයකට වට්ටම් ලබා දීම හේතුවෙන් නිසා නිවාසලාභීන්ගෙන් රු.385,000 ක් අඩුවෙන් අයකරගෙන තිබුණි.

## 2.4 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය<br>රු. මිලියන | උපයෝජනය<br>රු. මිලියන | ඉතිරිය<br>රු. මිලියන | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| 2013 | පුනරාවර්තන | 311.26 | 289.80 | 21.46 | 6.89 |
| | මූලධන | 2,730.88 | 2,211.84 | 519.04 | 19.01 |
| | **එකතුව** | **3,042.14** | **2,501.64** | **540.50** | **17.77** |
| 2014 | පුනරාවර්තන | 343.41 | 328.40 | 15.01 | 4.37 |
| | මූලධන | 4,296.39 | 2,994.80 | 1,301.59 | 30.29 |
| | **එකතුව** | **4,639.80** | **3,323.20** | **1,316.60** | **28.38** |
| 2015 | පුනරාවර්තන | 643.19 | 628.68 | 14.51 | 2.25 |
| | මූලධන | 5,716.69 | 5,691.11 | 25.58 | 0.45 |
| | **එකතුව** | **6,359.88** | **6,319.79** | **40.09** | **0.63** |
| 2016 | පුනරාවර්තන | 1,208.33 | 1,176.31 | 32.02 | 2.64 |
| | මූලධන | 6,594.75 | 6,556.12 | 38.62 | 0.58 |
| | **එකතුව** | **7,803.08** | **7,732.43** | **70.64** | **0.90** |
| 2017 | පුනරාවර්තන | 683.98 | 681.82 | 2.15 | 0.31 |
| | මූලධන | 6,849.15 | 6,849.15 | 0.00 | 0.00 |
| | **එකතුව** | **7,533.13** | **7,530.97** | **2.15** | **0.03** |

**2.5** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂයය අංක 12301 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා **තථ්‍ය අගය පහත දැක්වේ.**

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 11.00 | 10.96 | 5.50 | 8.20 | 45.00 | 26.35 |

වැඩ තහනම් කර ඇති නිලධාරියෙකුගෙන් අයවීමට ඇති රු.199,460 ක ණය ශේෂය අවුරුදු 01 මාස 06 ක් ගතවී තිබුණත් එම ශේෂය අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**2.6** **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|---|
| (අ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**2.7** **අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | |
| 5.4.12 මාර්ගෝපදේශය | එකතු කළ අගය මත බදු ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු නමුත් එසේ කර නොතිබුණි. |

| | |
|---|---|
| 2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 06(i), (ii) සහ 07 ඡේදයන් | චක්‍රලේඛය පරිදි කාර්තුවක් අවසානයේ එළඹෙන මස 15 වන දිනට ප්‍රථමව කාර්තුව තුළදී අලුතින් එකතුවූ වාහන, වාහන අපහරණය කිරීම්, ඇතුළු වූ වෙනත් වෙනස්වීම් පිළිබඳ තොරතුරු කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු නමුත් එසේ කර නොතිබුණි. |

## 2.8 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 110 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒකපුද්ගල වියදම රු.754,240 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 18 | 09 |
| (ii) | තෘතියික මට්ටම | 06 | 03 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 106 | 78 | 28 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 52 | 44 | 08 |
| (v) | වෙනත් | 03 | 03 | - |
| | **එකතුව** | **194** | **146** | **48** |

(ආ) මෙම අමාත්‍යාංශයේ පුරප්පාඩු 48 ක් පවතින අතර සමාලෝචිත වර්ෂයේ දී මෙම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. ඒ වෙනුවට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යන ආයතනවලින් වැටුප් ගෙවනු ලබන නිලධාරීන් 23 දෙනෙකු 2007 දෙසැම්බර් සිට 2017 දෙසැම්බර් දක්වා කාලය තුළ වරින් වර අමාත්‍යාංශයේ රාජකාරි කාර්යයන් සඳහා යොදවා ගෙන තිබුණු අතර, අමාත්‍යාංශයේ පුරප්පාඩු පැවතියදී අමාත්‍යාංශය මගින් වැටුප් ගෙවන නිලධාරිනියක් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ රාජකාරි සඳහා නිදහස් කර තිබුණි.